# Abstract 11

## රාගය පාලනය කිරීමෙහි සමාජ උපයෝගීතාව

**පූජ්‍ය. හත්තොටුවේ විජයධම්ම හිමි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ දර්ශනය),
*haththotuwa1988@gmail.com*

මුල් බුදුදහමේ එන සමස්ත ඉගැන්වීම් හා සංස්කෘතික චරණයන් විමසන විට එය සර්වප්‍රකාරයෙන් ම විරාගී දර්ශනයක් හා චරණයක් වේ. එහෙත් සත්ත්වයාගේ කායික හා මානසික වුවමනාවක් වශයෙන් පැන නැගෙන රාගය සම්බන්ධයෙන් බුදුදහමෙහි ගැඹුරු කියවීමක් ඇත. ස්ත්‍රිය පිළිබඳ පුරුෂයා තුළ සහ පුරුෂයා පිළිබඳව ස්ත්‍රිය තුළ ඇති වන රාගය තරම් ප්‍රබල වෙනත් කිසිදු කරුණක් තමන් වහන්සේ නො දකින බව වදාළේ එහෙයිනි. අනෙක් අතින් ලෝකය නිරන්තරයෙන් රාගයෙන් දැවෙමින් පවතින්නක් බව ද බුදුහු වදාළහ. මේ නිසා සමස්ත සමාජය තුළ රාගය දුරු කිරීම සඳහා වන ක්‍රියාවලියක් ලෝක ඉතිහාසයේ කිසිදු දිනයක නො වනු ඇත. බුදුන් වහන්සේගේ ඉගැන්වීම අනුව රාගය දුරු කිරීම සඳහා කැප වූ පිරිසක් වන්නේ භික්ෂු සමාජය යි. එබැවින් පොදු සමාජයට මෙය ප්‍රවේශ කිරීමේ න්‍යායයක් බුදුදහම තුළ නැත. පොදු සමාජය තේරුම් ගත යුත්තේ රාගය කළමනාකරණය කිරීමේ ප්‍රායෝගික වටිනාකම සහ ඒ සඳහා ඇති ක්‍රියා මාර්ගය යි. මෙම වටිනා ආගමික දාර්ශනික විඥානය මැනවින් සමාජගතවීමක් ශ්‍රී ලාංකික බෞද්ධ සමාජය තුළ දක්නට නැත. ඒ නිසා සමාජයක් වශයෙන් සිදුවන ව්‍යසන රාශියකි. බුදුදහම අනුව රාගය වූ කලී සියල්ල විනාශ කළ හැකි සුවිශාල ගින්නකි. ඊට සමාන ගින්නක් නැත. (නත්ථි රාගසමො අග්ගි) එබැවින් පවුල් සංස්ථාව තුළ රාගය පාලනය කර ගැනීමේ උපයා මාර්ග පිළිබඳව අවබෝධය පුළුල් විය යුතු ය. ඒ සඳහා වඩාත් වැදගත් වන්නේ ධර්මමය අවබෝධය යි. (අලගද්දූපම සූත්‍රය) කාම වස්තූන් සම්බන්ධ පරිහරණයේ පියවර තුනක් **අස්සාද, ආදීනව, නිස්සරණ** යනුවෙන් **මහාදුක්ඛක්ඛන්ධ** සූත්‍රයේ පෙන්වා දී ඇත. අනෙක් කරුණ වන්නේ අශුභ භාවනා ක්‍රමය යි. අරමුණෙහි මනස නො ඇලෙන තත්ත්වයට මනස සකසා ගැනීමෙන් ලබන වින්දනය හෙවත් **කේන්ද්‍රියාපසාරී වින්දනය** බුදුදහමෙන් අනුදත් වින්දන ක්‍රමය යි. මෙසේ විවිධ නයින් රාගය පාලනය කර ගැනීමේ ක්‍රමවේද හඳුනා ගැනීමෙන් රාගය පාලනය කර ගැනීමේ හැකියාවක් පවතින අතර එය ප්‍රායෝගික භාවිතයක් බවට පත් කිරීම බෞද්ධ චරණය වේ.

**ප්‍රමුඛ පද :** කෙලෙස්, බුදුරදුන්, නිවන, රාගය, විරාගී දර්ශනය